02 ඒකකය - කුලක

- 7 ශ්‍රේණිය ගණිතය පෙළ පොත් අංක 1හි පිටු අංක 12 හා 13 යටතේ දැක්වෙන කුලක හා කුලකයක අවයව යන උප මාතෘකාවට අයත් තොරතුරු හොඳින් අධ්‍යයනය කරන්න.

- ඒ අනුව පහත දැක්වෙන සමූහ කුලක හා කුලක නොවන අවස්ථා ලෙස වෙන් කරන්න.

1.	ඔබේ ගෙවත්තේ පිපෙන සුදු මල්	2.	පාද 4ක් ඇති සුරතල් සතුන්
3.	ලස්සන ඇඳුම්	4.	7 ශ්‍රේණියට අදාළ පාසල් පෙළ පොත්
5.	පාසලේ සිටින උස ගුරුවරු	6.	රස පලතුරු
7.	දිගම ගංගා	8.	ඔබේ පාසලේ ඇති නිවාස
9.	ආහාරයට ගන්නා හාල් වර්ග	10.	සූර්යග්‍රහ මණ්ඩලයේ දැනට සොයාගෙන ඇති ග්‍රහලෝක
11.	1සිට 20 දක්වා ඇති 2හි ගුනාකාර	12.	ඔබේ පන්තියේ ඉගෙනීමට දක්ෂ සිසුන්
13.	හොඳ ළමයින්	14.	ඔබේ පන්තියේ සිසුන්
15.	දේදුන්නේ පාට	16.	ලෝකයේ ලස්සන රටවල්

- 7 ශ්‍රේණිය ගණිතය පෙළ පොත් අංක 1හි පිටු අංක 14,15,16,17 හි **කුලකයක් ලියා දැක්වීම** හා **කුලකයක් වෙන් රූප සටහනකින් දැක්වීම** යන මාතෘකාව ඔස්සේ ඇති කරුණු හොඳින් අධ්‍යයනය කරන්න. ඒ අනුව පහත පැවරුම් හි යෙදෙන්න.
  - කුලක දැක්විය හැකි ආකාර කීයක් පිළිබඳව එහි දැක්වේ ද? ඒ මොනවා ද?
  - ඉහත කුලක දැක්විය හැකි ආකාර සඳහා උදාහරණ තුන බැගින් ලියන්න.
  - “20 හා 30 අතර ඇති ඉරට්ට සංඛ්‍යා” යන කුලකය ඉහත කුලක දැක්විය හැකි ආකාර සියල්ල ම මගින් දක්වන්න.
  - A = {SABARAGAMUWA වචනයේ ඇති අකුරු} ලෙස දී ඇති කුලකය වෙනත් ආකාර දෙකකින් දක්වන්න.

- පිටු අංක 17 හා 18 යටතේ ඇති 2.2 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.